᾿ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1945/40 - 2015 දෙසැම්බර් මස 18 වැනි සිකුරාදා - 2015.12.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2015 අංක 418/1

ජනා. කා. අංකය : සීඑස්ජ්/1/24/1/1

අතිගරු ජනාධිපතිතුමා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 45(1) වැනි ව්‍යවස්ථාව යටතේ, 2015 දෙසැම්බර් මස 04 වැනි දින සිට පාර්ලිමේන්තු මන්ත්‍රී කරුණාරත්න පරණවිතානගේ මැතිතුමා, පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යවරයා වශයෙන් පත්කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

අතිගරු ජනාධිපතිතුමාගේ නියමය පරිදි,

පී. බී. අබේකෝන්,
ජනාධිපති ලේකම්.

2015 දෙසැම්බර් මස 18 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය.

01 - 264/2

---

2015 අංක 418/2

ජනා. කා. අංකය : සීඑස්ජ්/1/24/1

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 43 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි අනුව්‍යවස්ථාව ප්‍රකාරව පත්කරන ලදුව 2015 සැප්තැම්බර් මස 14 දිනැති අංක 1932/7 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළ කරන ලද පහත සඳහන් අමාත්‍යවරයාගේ අමාත්‍ය ධූරය අතිගරු ජනාධිපතිතුමා විසින් 2015 දෙසැම්බර් මස 08 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ඔහුගේ නම ඉදිරියෙන් දක්වා ඇති පරිදි වෙනස් කරනු ලැබ ඇති බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ජාතික සංවාද අමාත්‍ය, ගරු මනෝ ගනේසන් මැතිතුමා, පා.ම. ''ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍ය'' වශයෙන්

අතිගරු ජනාධිපතිතුමාගේ නියමය පරිදි,

පී. බී. අබේකෝන්,
ජනාධිපති ලේකම්.

2015 දෙසැම්බර් මස 18 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය.

01 - 264/3

1A - G 22736 — 366 (2015/12)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

2015 අංක 418/3

ජනා. කා. අංකය : සීඑස්ජ්/1/24/1

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (1) වැනි අනුව්‍යවස්ථාව ප්‍රකාරව පත්කරන ලදුව 2015 සැප්තැම්බර් මස 18 දිනැති අංක 1932/69 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළ කරන ලද පහත සඳහන් රාජ්‍ය අමාත්‍යවරයාගේ රාජ්‍ය අමාත්‍ය ධූරය අතිගරු ජනාධිපතිතුමා විසින් 2015 නොවැම්බර් මස 11 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ඔහුගේ නම ඉදිරියෙන් දක්වා ඇති පරිදි වෙනස් කරනු ලැබ ඇති බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

| | |
|---|---|
| නීතිය හා සාමය සහ බන්ධනාගාර ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍ය ගරු පියංකර ජයරත්න මැතිතුමා, පා.ම. | "නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන රාජ්‍ය අමාත්‍ය" වශයෙන් |

අතිගරු ජනාධිපතිතුමාගේ නියමය පරිදි,

පී. බී. අබේකෝන්,
ජනාධිපති ලේකම්.

2015 දෙසැම්බර් මස 18 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය.

01 - 264/4

# රජයේ නිවේදන

## නිවේදනය

ජනා. කා. අංකය : සීඑස්ජ්/1/24/1

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 45(1) ව්‍යවස්ථාව යටතේ බලතල ක්‍රියාත්මක කරමින් අතිගරු ජනාධිපතිතුමා විසින් පළාත් සභා සහ පළාත් පාලන නියෝජ්‍ය අමාත්‍ය ධූරයට පත්කරනු ලැබූ පාර්ලිමේන්තු මන්ත්‍රී, ගරු කරුණාරත්න පරණවිතානගේ මැතිතුමා 2015 දෙසැම්බර් මස 03 වැනි දින සිට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 46(3)(ආ) ව්‍යවස්ථාව යටතේ එම නියෝජ්‍ය අමාත්‍ය ධූරයෙන් ඉල්ලා අස්වී ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

අතිගරු ජනාධිපතිතුමාගේ නියමය පරිදි,

පී. බී. අබේකෝන්,
ජනාධිපති ලේකම්.

2015 දෙසැම්බර් මස 18 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය.

01 - 264/1

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.